# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# පුරප්පාඩු

පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් 2021.01.20 වෙනි දින දක්වා මා විසින් භාරගනු ලැබේ.

## *වෛද්‍ය පීඨය*

### 01. ළමාරෝග අධ්‍යයන අංශය

**කථිකාචාර්ය (ආධුනික) / කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ) / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I**

### 02. පරපෝෂිතවේද අධ්‍යයන අංශය

**කථිකාචාර්ය (ආධුනික) / කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ) / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I**

## අයදුම් කරන පිළිවෙල

මෙම තනතුරු සඳහා අදාළ අයදුම්පත් හා විස්තර කාර්යාල වේලාවන් තුළදී නියෝජ්‍ය ලේඛකාධිකාරී / ආයතන අධ්‍යයන වෙතින් ලබාගත හැක. එසේම අන්තර්ජාලයේ www.kln.ac.lk විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිස අදාළ අයදුම්පත සහ තොරතුරු ලබාගත හැකිය. අයදුම්පත් හා විස්තර තැපෑලෙන් ලබාගැනීමට අවශ්‍ය නම් ඒ සඳහා ඉල්ලීමක් සහිතව ලිපිනය ලියූ මුද්දර සහිත සෙ.මී. 23 X 10 ප්‍රමාණයේ කවරයක් එවිය යුතුය. අයදුම්කරුවන් විසින් එක් එක් තනතුරු සඳහා වෙන වෙනම අයදුම්පත් යොමුකළ යුතු අතර, අයදුම්පත් අදාළ සහතිකවල පිටපත් සමග 2021.01.20 දින හෝ ඊට ප්‍රථම නියෝජ්‍ය ලේඛකාධිකාරී / ආයතන අධ්‍යයන, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස උඩ කෙළවරෙහි ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අපැහැදිලි හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු වේ. අවශ්‍ය නම් යෝග්‍යතාවයට අනුව තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට විශ්වවිද්‍යාලයට කටයුතු කළ හැකිය.

**ලේඛකාධිකාරී,**
**කැලණිය විශ්වවිද්‍යාලය,**
**කැලණිය.**
**2020.12.24**

Source: Dinamina, Daily News (2020.12.31)